# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 35 දරන
# මහා නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින]

අණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිළ: ශත 30 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

## 1987 අංක 35 දරන මහා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 51/86

**මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 35 දරන මහා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1981 අංක 33 දරන පනතින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ 327 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "වාර්ෂික වටිනාකම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 252 වන අධිකාරයේ 327 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"වාර්ෂික කුලිය" යන්නෙන්, යම් ගෙයක්, ගොඩනැගිල්ලක් ඉඩමක්, හෝ ගෙපතක් සඳහා සියලු පොදු වරිපණම් බදු හා බදු ගෙවීම කුලී නිවැසියා විසින් භාරගනු ලැබී නම් හා එහි කුලිය ඉල්ලා සිටීමට නිසි තත්ත්වයක ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත තබා ගැනීමට අවශ්‍ය අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා මනා ලෙස තබා ගැනීමේ වියදම් කිසිවක් වෙතොත් ඒ වියදම් දැරීමේ ගෙහිමියා විසින් භාරගනු ලැබී නම්, එක් වර්ෂයක් තවත් වර්ෂයක් සමග සැලකිල්ලට ගනු ලැබූ විට කුලී නිවැසියා විසින් ගෙවිය යුතු යයි සාධාරණව අපේක්ෂා කළ හැකි වාර්ෂික කුලිය අදහස් වේ ;

එසේ වුවද වාර්ෂික වටිනාකම ගණනය කිරීමේ දී හා තක්සේරු කිරීමේ දී කුලී නිවැසියකු රහිත වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා කිසිම ඉඩ හැරීමක් හෝ අඩු කිරීමක් නොකළ යුතුය ;'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර අයක මුදල් ගෙවා පසුව එළඹෙන ජන් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.